# තනතුරු - ඇබෑර්තු

### ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් කැඳවනු ලැබේ.

### 1. ප්‍රාථමික (ශිල්පීය)- රියදුරු -පුරප්පාඩු 02

***සුදුසුකම් :***

**බාහිර අයදුම්කරුවන් :**

*අධ්‍යාපන :*

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත්ව තිබීම;

*සහ*

බරවාහන සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ බලපත්‍රය ලබා තිබීම. බරවාහන බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවුරුදු 03 ක පළපුරුද්ද ලබා තිබීම (සහතික ඉදිරිපත් කළ යුතු වේ)

***අභ්‍යන්තර අයදුම්කරුවන් :***

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීමෙන් පසු රිය පැදවීම පිළිබඳ අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබීම;

*සහ*

ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL-2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL-1) සේවා ශ්‍රේණියක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

***වැටුප් පරිමාණය :***

2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය.

රුපියල් 43,280 - 10 X 490 – 10 X 540 – 10 X 590 – 12 X 630 – රු. 67,040/- (PL 3 – 2025)

ක් වන අතර එම වැටුප හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප ගෙවනු ලැබේ.

***වයස් සීමාව:***

අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**සෑම අයදුම්කරුවෙක් ම,**

I. ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතු ය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.
III. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

***අනෙකුත් දීමනා :***

ජීවන වියදම් දීමනාව සහ රජයෙන් අනුමත අනෙකුත් දීමනා

***බඳවා ගැනීමේ ක්‍රමය :***

ඉහත සඳහන් මූලික සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් අතුරෙන් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණු අනුපිළිවෙළ අනුව බඳවාගැනීම් සිදුකරනු ලැබේ.

***සේවා කොන්දේසි :***

මෙම තනතුර ස්ථිරය. වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ. සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා හිමිකම් ඇත. සේවකයා තම වැටුපෙන් 8% ක ප්‍රමාණයකින් හා සේවා යෝජකයා 12% ක ප්‍රමාණයකින් සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක වේ. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 3% ප්‍රමාණයක් සේවා යෝජකයා ගෙවනු ලබයි.

*අයදුම් කිරීමේ අනුපිළිවෙළ :*

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වෙබ් අඩවියේ https://judgesinstitute.lk/ පළකර ඇති ආදර්ශ අයදුම්පත අදාළ සහතික පත්‍රවල සහතික කරන ලද ඡායා පිටපත් සමග නිසි පරිදි සම්පූර්ණ කර **2026.10.31** වැනි දිනට හෝ එදිනට පෙර ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතු ය. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුරු නාමය සඳහන් කළ යුතු වේ. අයදුම්පත් ලියාපදිංචි තැපෑලට යොමු කරන දිනය නොව ආයතනයට ලැබෙන දිනය, වලංගු දිනය බවට සැළකීමේ අයිතිය ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සතුව පවතී.

එමෙන්ම අයදුම්පත් ලියාපදිංචි තැපැල මගින් යොමු කිරීමට අමතරව https://judgesinstitute.lk/ වෙබ් අඩවියේ අයදුම්කරන තනතුරට අදාළ සබැඳිය ඔස්සේ පවතින ගූගල් පෝරමය සම්පූර්ණ කර යොමු කළ යුතු ය.

රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවීමට කටයුතු කළ යුතු වේ. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තව ද, තැපෑලේ දී නැති වූ බවට ඉදිරිපත් කරනු ලබන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය,
අංක 80 (5 වන හා 6 වන මහල),
අධිකරණ මාවත,
කොළඹ 12.